# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ඩෙස්ක්ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක සැපයීම සහ ගෙනවිත් භාරදීම

**ප්‍රසම්පාදන අංකය : UOVT/PMD/NCB-02/G/01/2026**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත අයිතම ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අයිතම | විස්තරය | ප්‍රමාණය (ගණන) | ලංසු සුරක්ෂණය (රු.) | නැවත නොගෙවන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| I | සන්නාමගත ඩෙස්ක්ටොප් පරිගණක- විද්‍යාගාර යෙදුම් සඳහා | 118 | 576,000.00 | 12,500.00 |
| II | සන්නාමගත ඩෙස්ක්ටොප් පරිගණක- කාර්යාලයීය වැඩ සඳහා | 25 | 96,000.00 | |
| III | සන්නාමගත ලැප්ටොප් – සාමාන්‍ය භාවිතය සඳහා | 12 | 43,000.00 | |
| | එකතුව | | 715,000.00 | |

1. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයැවේ.
2. ලංසුකරුවන්ට තනි අයිතමයක් හෝ අයිතම කිහිපයක් සඳහා එක් එක් අයිතමයේ සම්පූර්ණ ප්‍රමාණයන් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකිය. ලංසු ඇගයීම එක් එක් අයිතමය පදනම් කරගනිමින් සිදු කරනු ලැබේ.
3. අවශ්‍ය සුදුසුකම් සහ අවශ්‍යතා
   i. ලංසුකරුට, **ලංසු සඳහා ආරාධනාවෙහි** දිනය වන විට, ඩෙස්ක්ටොප්/ ලැප්ටොප් පරිගණක රාජ්‍ය අංශය වෙත හෝ පිළිගත් සමාගම් වෙත සැපයීම සම්බන්ධයෙන් වසර 05කට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.
   ii. ලංසුකරු, වර්තමානයේදී, රාජ්‍ය අධිකාරියක් හෝ ජාත්‍යන්තරව පිළිගත් ආයතනයක් මගින් තහනම් කරන ලද, හෝ අසාධු ලේඛන ගත කරන ලද, ආයතනයක් නොවිය යුතුය.
   iii. ලංසු කැඳවීමේ දිනට පෙර පසුගිය වසර 05ක් ඇතුළත, එක් ව්‍යාපෘතියකදී මීට සමාන හෝ ඊට වැඩි ඩෙසක්ටොප්/ ලැප්ටොප් පරිගණක සංඛ්‍යාවක් අලෙවි කිරීම ඇතුළත් ව්‍යාපෘති අවම වශයෙන් තුනක් ලංසුකරු විසින් සම්පූර්ණකර තිබිය යුතුය. සනාථ කිරීමේ ලිපි ලේඛන අමුණා එවිය යුතුය. (මිලදී ගැනීමේ ඇණවුම්, ප්‍රදානය කිරීමේ ලිපි, කොන්ත්‍රාත් ගිවිසුම්)
   iv. පසුගිය වසර 3 ඇතුළත ඩෙසක්ටොප්/ ලැප්ටොප් පරිගණක විකිණීමෙන් ලද අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම ලංසු වටිනාකම මෙන් 1.5 ගුණයක් විය යුතුය.
   v. ලංසුකරු සතුව ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ වලංගු සහතිකයක් තිබිය යුතුය.
   vi. ඉදිරිපත් කරන ලද සන්නාමය සඳහා නිෂ්පාදකයා විසින් නිකුත් කරන ලද. නිෂ්පාදකයාගේ බලය පැවරීමේ සහතිකය.
4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ, සහකාර මූල්‍යාධිකාරී/ ප්‍රසම්පාදන කළමනාකරණ අංශය, (දුරකථන : 0112630733, ඊමේල් : **ab-supplies@uovt.ac.lk**) වෙතින්, ලබාගත හැකි අතර, 2026 පෙබරවාරි 03 වන දින සිට 2026 පෙබරවාරි 23 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර කාලයේදී විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන ඒකකයේදී ලංසු ලිපි ලේඛන පරීක්ෂාකොට බැලිය හැක.
5. සහකාර මූල්‍යාධිකාරී, ප්‍රසම්පාදන කළමනාකරණ අංශය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, රත්මලාන ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ඉහත වගුවෙහි දක්වා ඇති නැවත නොගෙවන ගාස්තුව ගෙවීමෙන් 2026.02.03 දින සිට 2026.02.23 දින දක්වා වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 තෙක් කාලයේදී අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් ඉහත සඳහන් කාලය තුළදී වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ, පරිපාලන ගොඩනැගිල්ලේ, සරප් වෙත ගෙවිය යුතුය. නැතහොත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුවට රත්මලාන ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 0070308457 දරන ගිණුමට ගෙවිය යුතුය. මුදල් ලදුපතෙහි/ තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත ලංසු ලිපි ලේඛන සමග අමුණා එවිය යුතුය. ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන අයිතම සංඛ්‍යාව හෝ ප්‍රමාණය නොසලකා, නැවත නොගෙවන ගාස්තුව සියලුම අයිතමයන් සඳහා පොදු වේ.
6. මුද්‍රා තබන ලද, ලංසු/ යෝජනා මුල්පිටපත සහ අනුපිටපත වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ප්‍රසම්පාදන කළමනාකරණ අංශය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල පාර, රත්මලාන** වෙත ලිපිනය යොමුකොට කවරයන්හි පහත පරිදි පැහැදිළිව සටහන් කළ යුතුය.
   - ✓ මුල් පිටපත– ඩෙස්ක්ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක සැපයීම සහ ගෙනවිත් භාරදීම – UOVT/PMD/NCB-02/G/01.2026
   - ✓ අනුපිටපත – ඩෙස්ක්ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක සැපයීම සහ ගෙනවිත් භාරදීම – UOVT/PMD/NCB-02/G/01/2026

   මුද්‍රා තබන ලද කවර දෙකම නැවත තනි කවරයක බහා ආරක්ෂිතව මුද්‍රා තබා එහි ඉහළ වම් කෙළවරේ **"ඩෙස්ක්ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක සැපයීම සහ ගෙනවිත් භාරදීම, අංකය - UOVT/PMT/NCB-02/G/01/2026"** යන්න සඳහන් කොට 2026.02.24 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ඉහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. නැතහොත් රත්මලාන, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන අංශයෙහි තබා ඇති තිල ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු/ යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප.ව. 2.00ට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ, පීඨ ගොඩනැගිලේ පීඨ මණ්ඩල කාමරයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ලංසු/ යෝජනා විවෘත කරනු ලැබේ.
7. සියලුම ලංසු/ යෝජනා සමග ඉහත වගුවෙහි දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය, **උපකුලපති, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,** නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත දේශීය වාණිජ බැංකුවක් වෙතින් ලබාගත යුතු අතර, 2026.06.22 දක්වා වලංගු විය යුතුය. විකල්පයක් ලෙස, බැංකුවක් විසින් නිකුත් කරන ලද ලංසු සුරක්ෂණය වෙනුවට අදාළ වටිනාකම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කළ හැක.
8. පූර්ව ලංසු රැස්වීමක් 2026.02.16 දින ප.ව. 2.00ට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පීඨ ගොඩනැගිල්ලේ, පීඨ මණ්ඩල කාමරයේදී පැවැත්වේ.
9. ලංසු සැකසීමේදී හා ගෙනවිත් භාරදීමේදී ලංසුකරුවන්ට දැරීමට සිදුවන ඕනෑම වියදමක් හෝ අස්ථානගතවීමක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.


**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන),**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,**
**අංක 100, කඳවල, රත්මලාන.**

**දුරකථන : 0112 630 733**
**ෆැක්ස් : 0112 630 738**
**වෙබ් : www.uovt.ac.lk**


**2026 පෙබරවාරි 03 වන දින**